# රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරි සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : - යොමු අංකය : - දිනය: -

1.2 අමාත්‍යාංශය: සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

යොමු අංකය : 01/05/01/244 දිනය : 2015.06.15

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/C2/37/05 දිනය : 2014.12.15

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය

යොමු අංකය : EST-3/RECRU/04/7108 දිනය : 2013.10.25

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

| | |
|---|---|
| යොමු අංකය : NSCC/6/37/SR | දිනය : 2013.08.15 |
| NSCC/6/37/SR | 2015.07.30 |
| NSCC/6/37/SR | 2017.10.20 |

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/04-01-37/02/2014 දිනය : 2018.02.06

පළමු සංශෝධිත දිනය : 2018.04.17

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03.සේවා ගණය පිළිබඳ විස්තරය

3.1.සේවා ගණය : වෛද්‍ය නිලධාරි

3.2.ශ්‍රේණි : ප්‍රාථමික ශ්‍රේණිය

II ශ්‍රේණිය

I ශ්‍රේණිය

3.3.පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මඟින් ජනතාවගේ ශාරීරික , මානසික හා සමාජීය යහ පැවැත්ම පවත්වා ගෙන යාමේ අරමුණින් මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස රෝග විනිශ්චය, චිකිත්සක, නිවාරණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු ඉටු කිරීම.

3.4 . ශ්‍රේණිගතව කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යොග්‍යතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04 .තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

( විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

05. වැටුප් පරිමාණය

5.1 වැටුප් කේත අංකය : SL 2 - 2016

**5.2** මාසික වැටුප් පරිමාණය : රු 52,955 -3x1,335- 7x1,345- 2x1,630-16x2,170- 104,355/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය රු. |
|---|---|---|
| ප්‍රාථමික | පියවර 02 | **54,290/-** |
| II | පියවර 05 | **58,305/-** |
| I | පියවර 14 | **71,805/-** |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| හෝමියෝපති වෛද්‍ය නිලධාරි | ප්‍රාථමික, II,I | 05 | **01.**හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මගින් රෝග හඳුනාගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීම<br>**02.** රෝග නිවාරණ කටයුතු<br>**03.**රෝග වැළැක්වීම සම්බන්ධ උපදෙස් ලබා දීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා ප්‍රාථමික ශ්‍රේණිය, II ශ්‍රේණිය හා I ශ්‍රේණියන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100 % |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ප්‍රාථමික ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටක පිහිටි විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර 5½ කට නොඅඩු පූර්ණ කාලීන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ලබා ගත් හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

හෝමියෝපති වෛද්‍යවරයකු වශයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. සේවයට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු ඉහත 7.2.2 වන ඡේදයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

7.2.3. වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 25 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : සුදුසුකම් පරීක්ෂා කිරීම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරේ.

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 | |
| භාෂා ප්‍රවීණතාවය | 15 | |
| වෛද්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන සඳහා | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |

සටහන :

i. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

ii. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත,යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

iii. විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කළ යුතු වේ.

7.2.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණ/ සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | ප්‍රාථමික ශ්‍රේණියට පත් වී වසර තුනක් (03 ) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් මඟින් (ඇමුණුම 01) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් මඟින් (ඇමුණුම 02) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවතාවක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පරිපාලන බලතල පවරන ලද සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින්

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙකුත් භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 ප්‍රාථමික ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

#### 10.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

i. සේවා ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වසර 02ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 02 ක් උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනයට පෙරාතුව වූ වසර දෙකක් (02) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

#### 10.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

"සංලක්ෂය

උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය."

### 10.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

#### 10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි පිරිනමනු ලබන ආයතනයකින් හෝ වසරකට නොඅඩු රෝහල් කළමනාකරණය හෝ සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

(ii) හෝමියෝපති වෛද්‍ය නිලධාරි II වන ශ්‍රේණියේ වසර 08 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 08 ක් උපයාගෙන තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

(vi) සේවයේ ස්ථිර කර තිබීම.

#### 10.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

"සංලක්ෂය

උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය."

11. තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන :

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

i. මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති SL-2-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

iii. ප්‍රාථමික ශ්‍රේණියේ වසර 02 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කළ දිනය හෝ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වන සක්‍රිය හා සතුටුදායක සේවා කාලය II ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සේ සළකනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රයේ විධි විධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධි විධාන සලකා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන :

මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරන දින සිට ඉදිරියට වන වසර 05 ක කාලපරිච්ඡේදය තුළ පහත අධ්‍යාපන සුදුසුකම් යටතේද බඳවා ගැනීම් සිදු කළ හැක.

i. ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටක පිහිටි විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර වසර 04 කට නොඅඩු පූර්ණ කාලීන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හා ඉන් පසුව වසර 03ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

ii. මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වීමට ප්‍රථම පශ්චාත් උපාධි ක්ෂේත්‍රයන් නිශ්චය කර නොමැති බැවින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අනුමැතිය මත, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි පිරිනමනු ලබන ආයතනයකින් ලබා ගත් වසරකට නොඅඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද I පන්තිය උසස්වීම් සඳහා සළකා බලයි.

සකස් කළේ :-

අත්සන..........................................

(විෂයභාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර :

දිනය : 2018.08. 13

පරීක්ෂා කළේ :-

අත්සන..........................................

(විෂයභාර මාණ්ඩලික නිලධරයා)

නම : ඉනෝෂා අසන්ති පෙරේරා

තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (වැ.බ.)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

දිනය : 2018 .08.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන) එල්. එච්. තිලකරත්න

නම : අතිරේක ලේකම් (පාලන)

තනතුර: සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී.බී.ජයා මාවත, කොළඹ 10.

දිනය : 2018.08. 15

නිලමුද්‍රාව

යොමු අංකය:

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.02.06 දින අනුමත කරන ලද රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරි සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන..........................................

නම :

ලේකම්

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දිනය : 2018 .08 26

නිල මුද්‍රාව

බී. ජී. එස්. ගුණතිලක
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

රජයේ හෝමියෝපති රෝහලේ වෛද්‍ය නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ....... 2018.02.06 ........ දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන.................................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2018/09/17

නිල මුද්‍රාව

**එම්. ඒ. බී. දයා සෙනරත්**
**ලේකම්**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**නො. 1200/9, රජමල්වත්ත පාර,**
**බත්තරමුල්ල.**

ඇමුණුම - 01

## විභාග / වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : හෝමියෝපති වෛද්‍ය නිලධර ගණයේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාග/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | පැය 1 ½ | 100 | 40% |
| ආයතන සංග්‍රහය | පැය 1 ½ | 100 | 40% |
| ආරෝග්‍යශාලා පරිපාලනය | පැය 1 ½ | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බලය පවරන ලද සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවතාවක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහය 1 වන කාණ්ඩයේ V,V1,V11,V111,X11,X111,X1V,XX11.XXV11,XX1X,XXX,XXX11 පරිච්ඡේදය සහ 11 වන කාණ්ඩයේ XLV11 පරිච්ඡේදය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වන කාණ්ඩය (X පරිච්ඡේදය හැර) |
| ආරෝග්‍යශාලා පරිපාලනය | (අ) ආරෝග්‍යශාලා පිළිබඳ බල පැවැත්වෙන සාමාන්‍ය නීතිරීති<br>(ආ) ආරෝග්‍යශාලා පිරිසිදුව තබා ගැනීම<br>(ඇ)රෝගීන් සම්බන්ධව බල පැවත්වෙන නීති රීති<br>(ඈ) රෝගීන්ට නියමිත ආහාර පාන ලබා ගන්නා විධි<br>(ඉ) රෝගීන් ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති<br>(ඊ)ආරෝග්‍යශාලා වල වෛද්‍ය අධිකාරිගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුනට අයත් රාජකාරි පිළිබඳ ඇති අවබෝධය<br>(උ) ආරෝග්‍යශාලා වල සාමාන්‍ය පාලන කටයුතු<br>(ඌ) සෞඛ්‍ය, පෝෂණ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සාමාන්‍ය පාලන රෙගුලාසි<br>(එ) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ගබඩා වල ගිණුම්, ලිපි ලේඛන, පොත්පත් පවත්වාගෙන යාමට අදාළ රෙගුලාසි<br>(ඒ) සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්යය සංවිධාන සංග්‍රහය |

අත්සන.......................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

එල්. එච්. තිලකරත්න
අතිරේක ලේකම් (පාලන)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී.බී.ජයා මාවත, කොළඹ 10.

නම :.......................................

තනතුර :.......................................

දිනය :..2018..08..15..................

නිල මුද්‍රාව :

ඇමුණුම - 02

<u>විභාග / වෘත්තීය පරීක්ෂණ පිළිබඳ විස්තර</u>

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : හෝමියෝපති වෛද්‍ය නිලධර ගණයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාග/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණය හා සංවිධාන ක්‍රම | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බලය පවරන ලද සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවතාවක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය හා සංවිධාන ක්‍රම | (i) කළමනාකරණය හා සංවිධාන පිළිබඳ මූලධර්ම<br>(ii) සාමාන්‍ය පරිපාලනය මෙහෙයවීම සඳහා න්‍යායාත්මක මූලධර්ම යොදා ගැනීම<br>(iii) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම |

අත්සන............................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

එල්. එච්. තිලකරත්න
අතිරේක ලේකම් (පාලන)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී.බී.ජයා මාවත, කොළඹ 10.

නම :............................................

තනතුර :............................................

දිනය :..2018.08.15............

නිල මුද්‍රාව :